**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව - 2016**
**-----------------------------------**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 31(1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම
---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම
**-------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 –1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම

1999 වර්ෂයේදී ජාතික චිත්‍රපට සංස්ථාව සතුව පැවති චිත්‍රපටි බෙදාහැරීමේ ඒකාධිකාරය අහෝසි කිරීමත් සමඟ සංස්ථාව සතුව පැවති ප්‍රධාන ආදායම් මාර්ගයක් වූ බෙදාහැරීමේ කොමිස් මුදල අහිමි වී තිබුණි. ඒ හේතුවෙන් සංස්ථාවේ ආදායම වියදම් පියවා ගැනීමට ප්‍රමාණවත් නොවීම මත මහා භාණ්ඩාගාරය විසින් 2011 වර්ෂයේ සිට සේවක වැටුප් සඳහා ප්‍රතිපාදන ලබාදීමට කටයුතු කර තිබුණි.

තවද, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක කාලය තුල සංස්ථාව භාණ්ඩාගාර ප්‍රදාන ලැබීමට පෙර දිගින් දිගටම අලාභ ලැබීමේ තත්ත්වයක් නිරීක්ෂණය වූ අතර ඒ අනුව රජයේ මූල්‍ය සහායක් නොමැතිව සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාම අවිනිශ්චිත තත්ත්වයක පවතින බව නිරීක්ෂණය විය.

## 1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට ජාතික චිත්‍රපට සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7**

ප්‍රමිතයේ 7 වන වගන්තිය අනුව, භාණ්ඩාගාර බිල්පත් සහ ප්‍රතිවිකුණුම් බිල්පත් ගිණුම්ගත කිරීමේදී මාස 3ක් හෝ ඊට අඩු ආයෝජනයන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් හා සමාන ද්‍රවශීල වත්කමක් ලෙස පෙන්නුම් කළ යුතු වුවද මාස තුනක කාලයක් තුලදී කල්පිරීමට නියමිත භාණ්ඩාගාර බිල්පත් වටිනාකම රු.9,612,350 ක් හා බිල්පත් ප්‍රතිවිකුණුම් රු.103,361,405 ක් මුදල් හා මුදල් සමාන දෑ යටතේ දක්වා තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16**

---

(i) ප්‍රමිතයේ 79(අ) ඡේදය ප්‍රකාරව නිෂ්කාර්ය වත්කම් පිළිබඳව ගිණුම් ප්‍රකාශනවල හෙළිදරව් කළයුතු වුවත් සංස්ථාවේ කැලණිය චිත්‍රාගාරයේ කලුසුදු සහ වර්ණ රසායනාගාර වලට අයත් තාක්ෂණය යල්පැනගිය පැරණි වත්කම්, ගිණුම්ගත කිරීම හා ඒ පිළිබඳව හෙළිදරව් කිරීම සිදුකර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 79 (ආ) ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 250,899,989 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තව දුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19**

---

ප්‍රමිතයේ 57 ඡේදය ප්‍රකාරව ආයුගණක තක්සේරුවක් සිදුකර පශ්චාත් සේවක ප්‍රතිලාභ වෙන්කිරීම් ගණනය කළ යුතු වුවත්, ඊට පටහැනිව ආයතනය විසින් පශ්චාත් සේවක ප්‍රතිලාභ වෙන්කිරීම් සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගැනීමකින් තොරව සෑම සේවකයකුටම සේවය කරන ලද එක් වර්ෂයකට මාස භාගයක වැටුපට සමාන පාරිතෝෂික මුදලක් වෙන්කර තිබුණි.

**(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37**

---

සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා 2006 ජනවාරි සිට 2015 දෙසැම්බර් දක්වා ජීවන වියදම් දීමනාව සැලකිල්ලට නොගෙන දායක මුදල් ගණනය කිරීම නිසා රු. 2,763,753 ක හිඟ මුදලක් සහ රු. 1,381,876 ක අධිභාරය ගෙවීමට සිදුව තිබූ අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය 2017 අප්‍රේල් 27 ලබා දී තිබුණද ප්‍රමිතය පරිදි ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

**(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 38**

---

ප්‍රමිතයේ 119 ඡේදය ප්‍රකාරව කැලණිය සරසවි චිත්‍රාගාරයේ පශ්චාත් නිෂ්පාදන කටයුතු සඳහා භාවිතා කරන මෘදුකාංගය මූල්‍ය ප්‍රකාශනවල අස්පෘශ්‍ය වත්කම් යටතේ දැක්විය යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 40**

---

ප්‍රමිතයේ 75(ඇ) ඡේදය ප්‍රකාරව ආයෝජන වත්කම් හඳුනාගෙන ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතු වුවත් සංස්ථාව විසින් වසර 15 ට වැඩි කාලයක් තුළ ආයතන තුනකට කුලියට ලබාදී ඇති ගොඩනැගිල්ලක් පිළිබඳව සුදුසු අනාවරණය කිරීම් සිදු කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

දේපල පිරිවැයට හෝ තක්සේරු අගයට ගිණුම්ගත කිරීම ප්‍රතිපත්තිය බව මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණද සංස්ථාවට අයත් බෞද්ධාලෝක මාවතේ පිහිටි වරිපනම් අංක 224 ඉඩම සහ කැලණිය චිත්‍රාගාරයේ ඉඩම 2007 වර්ෂයේදී අවසාන වරට තක්සේරු කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට වසර 10 ක් ගත වී තිබුණද මෙම ඉඩම් නැවත තක්සේරු කර සධාරණ අගය ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

දිගුකාලීන තැන්පතුවක් වූ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ස්ථාවර තැන්පතු වටිනාකම රු. 17,891,742 ක් කෙටිකාලීන ආයෝජනයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුළත් ගිණුම් විෂයයන් 02 කට අදාළ ශේෂ විගණනය සඳහා ඉදිරිපත් කළ උපලේඛන /ලෙජර් ශේෂයන් සමග සැසඳීමේදී රු. 13,495,075 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සංස්ථාවේ පොත්පත් සහ රිත්මා මණ්ඩලයේ පොත්පත් අනුව අන්තර් දෙපාර්තමේන්තු ජංගම ගිණුමක රු. 4,696,302 ක පැහැදිලි නොකළ වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ බැංකු ජංගම ගිණුමක බැංකු ශේෂය රු. 10,607,968 ක් වුවද, බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව එම ශේෂය රු. 6,607,968 ක් වූයෙන් රු. 4,000,000 ක නොසැසඳු වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ණය ගැතියන්ගෙන් වැඩිපුර අයකරගත් මුදල් අදාළ පුද්ගලයන්ට නැවත ගෙවීමට හෝ ආදායමට ගැනීම හෝ වෙනත් සුදුසු ක්‍රියා මාර්ගයක් ගැනීමට යොමු නොවීම හේතුවෙන් රු. 1,110,955 ක් වූ ණය ගැති බැර ශේෂ අවුරුදු 10 කට අධික කාලයක සිට ගිණුම්වල ඉදිරියට ගෙන එමින් තිබුණි.

(ආ) මරදාන සිනේසිටි සිනමා ශාලාවෙන් 2003 වර්ෂයේ සිට 2016 මැයි 31 දින දක්වා අයවිය යුතු චිත්‍රපට කුලිය රු. 12,343,433 ක් මෙම වාර්තාවේ දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර 2016 මැයි 31 දිනට පසු දෛනික වාර්තාව එවා නොමැති බැවින් අයවිය යුතු චිත්‍රපට කුලී ආදායම ගණනය කිරීමට සහ ගිණුම් වලින් අනාවරණය කිරීමට නොහැකි වී තිබුණි.

(ඇ) ස්වෙච්ඡාවෙන් සේවකයින් විශ්‍රාම ගැන්වීම වෙනුවෙන් භාණ්ඩාගාරයෙන් ලැබී තිබූ වන්දි මුදලින් ඉතිරිව පැවති රු. 5,000,000 ක් නැවත භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර නොතිබුණි.

(ඇ) 2001 වර්ෂයේ සිනමා ශාලාවල චිත්‍රපට බෙදා හැරීමේ කටයුතු පෞද්ගලික මණ්ඩලවලට පැවරීමට පෙර සිනමා ශාලා 163 කින් රු. 7,604,528 ක් හා පැවරීමෙන් පසු පැවති එහෙත් දැනට වසා දමා ඇති සිනමාශාලා 186 කින් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු. 74,412,984 අයවිය යුතුව පැවතුණි. තවද දැනට ක්‍රියාත්මක වන මණ්ඩලවලට අයත් සිනමාශාලා වලින් අයවිය යුතු හිඟ මුදල් ප්‍රමාණය රු. 149,054,764 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී ද එම මුදල් අයකර ගැනීමට ඵලදායී පියවර ගෙන නොතිබුණි.

(ඉ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට සිනමාහල් නිෂ්පාදන, වෙනත් ණය සහ සේවක අත්තිකාරම් වශයෙන් මුළු ණය එකතුව රු. 501,105,452 ක් අයකර ගත යුතුව තිබුණි. එම ණයගැතියන්ගෙන් රු. 129,103,283 ක් වූ එකඟ නොවූ සහ අයකරගත නොහැකි ණය ශේෂය සඳහා සියයට 100 ක බොල් ණය ප්‍රතිපාදනයක් ද ඉතිරි ණයගැතියන් සඳහා සියයට 5 ක බොල්ණය ප්‍රතිපාදනයක් ද සිදුකර තිබුණි. කෙසේ වුවද ඉහත ණයගැතියන් ගෙන් රු. 146,733,583 ක් හෙවත් සියයට 29 ක් ආපසු අයකර ගැනීම අවිනිශ්චිත බව නිරීක්ෂණය විය.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 381(1) | රාජකාරී බැංකු ගිණුම් ආරම්භ කිරීම සඳහා ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා මගින් මහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබාගත යුතු වුවත්, 2016 දෙසැම්බර් 31 දින වන විට සංස්ථාව විසින් බැංකු ජංගම ගිණුම් 08 ක් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ආරම්භ කර තිබූ අතර එදිනට එම බැංකු ගිණුම්වල ශේෂ එකතුව රු. 36,705,863 ක් වී තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 454 (1) | ඉන්වෙන්ට්‍රි භාන්ඩ ලැබීම්, නිකුත් කිරීම් සම්බන්ධයෙන් 44 පොදු ආකෘතියට අනුව ප්‍රධාන බඩු වට්ටෝරු ලේඛනයක් පවත්වා ගැනීම සිදුකර නොතිබුණු අතර, ඒ ඒ අංශ සඳහා වෙන් වෙන් වශයෙන් අදාළ ආකෘති ප්‍රකාරව ලේඛන පවත්වා නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 754 | සෑම මුදල් වර්ෂයක් අවසානයේදීම බඩු ලේඛන පොත තුළනය කර ඊළඟ මුදල් වර්ෂයට ඉදිරියට ගෙනයාම සිදු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 2015 ජූලි 22 දිනැති අමප/05/0741/041/012 අංක දරන අමාත්‍ය මණ්ඩල තීරණය | රාජ්‍ය ආයතනවලින් බැහැර කෙරෙන තඹ, පිත්තල, ඇලුමිනියම්, ඊයම් ආදී යකඩ නොවන ලෝහද විශේෂ වර්ගයන්හි යකඩ, ටීනච්චට්ටි, හා වානේ සුන්බුන්ද ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට අලෙවි කළ හැකි වුවත්, සරසවි චිත්‍රාගාරයේ පැරණි ගොඩනැගිල්ලක ගොඩගසා තිබූ යකඩ, සුන්බුන් හා දළ සේයාපට ආවරණ සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | (i)1971 මුදල් පනතේ 10(5) සහ 11වන වගන්ති සහ 1971 අංක 47 දරන චිත්‍රපට සංස්ථා පනතේ 27වන වගන්තිය | 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ වියදම් ඉක්ම වූ ආදායම රු. 111,502,287 ක් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර නොතිබුණු අතර එම වටිනාකම ද ඇතුළත්ව රු. 92,031,681 ක් හා රු. 173,871,346 ක් 2016 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිවිකුණුම් වල මුදල් ඇමතිවරයාගේ හා අදාල ඇමතිවරයාගේ අනුමැතියකින් තොරව ආයෝජනය කර තිබුණි. |
| | (ii) මුදල් පනතේ 7(2) වගන්තිය | සමාලෝචිත වර්ෂයේදී රජයෙන් ලැබූ ආධාර මුදල වූ රු. 74,250,000 ක් සංස්ථාවේ ලාභය ගණනය කිරීමේදී සැළකිල්ලට නොගෙන නොතිබුණු අතර ලාභය / අලාභය ගණනය කිරීමෙන් පසුව විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ පෙන්වා තිබුණි. |
| (ඇ) | 1999 ජුනි 17 දිනැති ජාතික චිත්‍රපට ප්‍රතිපත්තිය හා මාර්ගෝපදේශය<br>(i) 2.1 වගන්තිය | චිත්‍රපට මුද්‍රණය හා ප්‍රචාරණය වැනි පශ්චාත් නිෂ්පාදන කටයුතු සඳහා උපරිමය රු. මිලියනයක් දක්වා ණය, මහජන බැංකුව මගින් සපයනු ලැබිය යුතු වුවත් ඊට පටහැනි ලෙස චිත්‍රපට සංස්ථාවේ අරමුදලින් රු. මිලියන 20 ක ණය මුදලක් “සරිගම” චිත්‍රපටය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව ලබා දී තිබුණි**.** |
| | (ii) 9 වගන්තිය | චිත්‍රපට සුරක්ෂිතාගාරයක් පිහිටුවා එහි කළමනාකරණය චිත්‍රපට සංස්ථාව විසින් පවත්වාගෙන යා යුතු වුවත් චිත්‍රපට සංස්ථාව සතු පැරණි චිත්‍රපට 273 ක් පමණ ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ සුරක්ෂිතාගාරයක තැන්පත් කර තිබුණි. කෙසේ වෙතත් 1947 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා තිරගත වූ චිත්‍රපට 962 ක් සහ නව චිත්‍රපටවල පිටපත් සුරක්ෂිත කිරීම සඳහා වැඩපිළිවෙලක් සකස්කර නොතිබුණි. |
| (ඉ) | සුරාබදු නිවේදන අංක 902 හි 111 උපලේඛනයේ (ඒ) හා (සී) වගන්තිය | පූජනීය ස්ථානයකට හෝ පාසලකට මීටර් 500 ක් ඇතුළත හා රටබීම විකුණන ස්ථානයේ තිබිය යුතු වපසරිය වර්ග අඩි 500 කට අඩුනම් රටබීම අලෙවි බලපත්‍ර නිකුත් නොකළ යුතුමුත් ඒ පිළිබඳ පරීක්ෂාවකින් තොරව සිනමාහල්වලට රටබීම අලෙවි බලපත්‍ර සඳහා නිර්දේශ නිකුත් කර තිබුණි. |
| (ඊ) | 1971 අංක 47 දරන චිත්‍රපට සංස්ථා | ත්‍රිමාණ (3D) චිත්‍රපට සඳහා චිත්‍රපට ප්‍රදර්ශනාගාරවල |

| | |
|---|---|
| පනතේ 61(2) (ඉ) වගන්තිය | අය කළ යුතු ගාස්තුව සංස්ථාව විසින් අනුමත කරන ලද ගාස්තුවට වඩා රු. 100 ක් වැඩියෙන් අයකර තිබූ අවස්ථා නිරීක්ෂණය වූ අතර සංස්ථා විමර්ෂණ නිලධාරීන් විසින් එවැනි අවස්ථා නිරීක්ෂණය කර නිවැරදි කර නොතිබුණි. |

3. **මූල්‍ය සමාලෝචනය**
---------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**
---------------

සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලය භාණ්ඩාගාර ප්‍රදාන ලැබීමට පෙර රු.34,638,806 ක අලාභයක් වූ අතර, එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ අලාභය රු.59,186,725 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.24,547,919 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. වෙනත් ආදායම් රු. 13,380,566 කින් ඉහලයාම සහ බොල්ණය හා පාරිතෝෂික වෙන්කිරීම් රු.23,539,330 කින් අඩුවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී භාණ්ඩාගාර ප්‍රදාන ලැබීමට පෙර මූල්‍ය ප්‍රතිඵලයේ අඛණ්ඩ අලාභයක් ඇති වී තිබුණු අතර 2012 වර්ෂයේදී රු. 50,487,786 ක් වූ එය සමාලෝචිත වර්ෂය අවසානයට රු.34,638,806 ක් වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමෙන් පසු 2012 වර්ෂයේදී රු. 31,192,547 ක් වූ සංස්ථාවේ දායකත්වය සමාලෝචිත වර්ෂය අවසානයට රු.67,483,892 ක් දක්වා වර්ධනය වී තිබුණි.

4. **මෙහෙයුම් සමාලෝචනය**
----------------------------

**4.1 කාර්යසාධනය**
----------------

1971 අංක 47 දරන ජාතික චිත්‍රපට සංස්ථා පනත අනුව චිත්‍රපට නිෂ්පාදනය හා ප්‍රදර්ශනය සඳහා අවශ්‍ය පටල පට, චිත්‍රපට, ඡායාරූප උපකරණ ආනයනය, බෙදා හැරීම හා සැපයීම, චිත්‍රපට මිලට ගැනීම හා ගබඩා කිරීම ඇතුළුව චිත්‍රපට අපනයනය කිරීම සහ චිත්‍රපට නිෂ්පාදනය සඳහා චිත්‍රාගාර හා චිත්‍රපට ප්‍රදර්ශනාගාර පිහිටුවීම, පහසුකම් සැපයීම හා මූල්‍ය වශයෙන් සහය වීම, චිත්‍රපටවල නිෂ්පාදකයන්ට උපහාර දැක්වීම, ත්‍යාග හා සම්මාන ප්‍රදානය කිරීම, සාකච්ඡා හා සම්මන්ත්‍රණ සංවිධානය කිරීම හා පැවැත්වීම, චිත්‍රපට උළෙල පැවැත්වීම, චිත්‍රපට පිළිබඳ වාර සඟරා පලකිරීම හා ශ්‍රී ලංකාව ඇතුළත හා ශ්‍රී ලංකාවෙන් පිටත චිත්‍රපට සම්බන්ධයෙන් වෙළඳපල පර්යේෂණ පැවැත්වීම ආදී අරමුණු ඉටුකර ගැනීම සඳහා සංස්ථාව පිහිටුවා ඇත.එම අරමුණු ඉටුකර ගැනීමට අදාළව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රූපවාහිනී හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක කුසලතාවයන් පෙන්වා ඇති තරුණ සිනමාකරුවන්ට තම ප්‍රථම සිනමා නිර්මාණය සඳහා රාජ්‍ය අනුග්‍රහය දැක්වීම වශයෙන් වසරකට හොඳ චිත්‍රපට 04 ක් චිත්‍රාගාර නිෂ්පාදන වශයෙන් සම නිෂ්පාදනය කිරීම සඳහා රු. මිලියන 12 ක් වෙන්කර තිබුණද එම කාර්යය ඉටුකර නොතිබුණි.

(ආ) සිනමා කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ මූලික අරමුණින් චිත්‍රපට නිෂ්පාදනයෙහිලා මූල්‍යමය සහය දැක්වීම අරමුණක් වුවත් 2012 වර්ෂයේ සිට කිසිදු නිෂ්පාදන ණයක් ලබා දී නොතිබූ අතර ශ්‍රී ලංකාව ඇතුළත හා ශ්‍රී ලංකාවෙන් පිටත චිත්‍රපට සම්බන්ධයෙන් වෙළඳපල පර්යේෂණ පැවැත්වීම ආදී අරමුණු ඉටුකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) සෑම සිනමා ශාලාවක්ම අවම වශයෙන් මාසයකට එක් වතාවක් පරීක්ෂාවට ලක්වන පරිදි එනම් සමස්තයක් ලෙස දර්ශන වාර 2000 ක් වත් පරීක්ෂා කිරීමට සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂය තුළ දර්ශන වාර 850 ක් පමණක් පරීක්ෂාවට ලක්කර තිබුණි.

(ඈ) ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව චිත්‍රපට බහුමාණ ශබ්ද (Surround Sound) මිශ්‍රණය කිරීම සඳහා විජය කුමාරණතුංග මැදිරියේ ධ්වනි පාලනය කර (Acoustic treatment) උපකරණ මිලදීගෙන සවිකිරීම සහ චිත්‍රපට සඳහා ගීත සහ සංගීතය පටිගත කිරීම සඳහා උපකරණ මිලදී ගැනීමට රු. මිලියන 30 ක් වෙන්කර තිබුණද එම කාර්යය ඉටුකර නොතිබුණි.

(ඉ) චිත්‍රපට කර්මාන්තය පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කිරීමට නියමිත ඒකකයක් සංස්ථාව තුළ ස්ථාපනය කර නොතිබුණු අතර, ප්‍රේක්ෂකයන්ගෙන් හා චිත්‍රපට නිෂ්පාදකයින්ගෙන් ලැබෙන පැමිණිලි ලේඛනගත කිරීම හා පැමිණිලි අදාළ අංශ වෙත යොමුකර කාලීනව සුදුසු ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳ අවධානය යොමුකර නොතිබුණි. තවද, චිත්‍රපට කර්මාන්තයේ උන්නතිය උදෙසා ජාතික ප්‍රතිපත්ති සැකසීමට ද කටයුතු කර නොතිබුණි. ශ්‍රී ලාංකීය සිනමාවේ අනන්‍යතාවය රැකගනිමින් ජාත්‍යන්තර තත්ත්වයට ළඟාවිය හැකි නිර්මාණ බිහි කිරීම සංස්ථාවේ දැක්ම වුවත්, අවශ්‍ය මූල්‍යමය පහසුකම් ලබා නොදීම මත නවක නිෂ්පාදකවරු හට ඉදිරියට ඒමට බාධාවන් පැන නැගී තිබුණු අතර, හරවත් නිර්මාණ බිහි කිරීම වෙනුවට වානිජමය චිත්‍රපටවලට යොමු වී මුදල් ඉපයීම ප්‍රධාන අරමුණ බවට පත් වී තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ කම්කරුවන් 10 දෙනෙකුගේ අතිරික්තයක් පැවතියදී මාසිකව රු. 293,490ක් ගෙවීමේ එකඟතාවය මත සංස්ථාවේ පිරිසිදු කිරීම් කටයුතු තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රතික්ෂේප කර තිබූ පෞද්ගලික සේවා සැපයුම්කරුවකු වෙත පවරා තිබුණු අතර අවශ්‍ය සේවක සංඛ්‍යාව යෙදවීමට මෙම ආයතනය අපොහොසත් වීම හේතුවෙන් අසතුටුදායක සේවා සැපයීමක් දිගින් දිගටම සිදු කර තිබුණි.

(ආ) සංස්ථාවට සිනමා ශාලාවලින් අයවිය යුතු හිඟ මුදල් සහ චිත්‍රපට නිෂ්පාදනය සඳහා ලබාදී ඇති ණය මුදල් රු.මිලියන 192 ක් කපා හැරීම සඳහා අනුමැතිය ඉල්ලීමේ ලිපියට පිළිතුරු වශයෙන් 2015 අගෝස්තු මාසයේ අංක PE/ME/NFC/GEN/2015 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු අධ්‍යක්ෂක ජනරාල්ගේ ලිපිය පරිදි පහත අඩුපාඩු සිදුවී ඇති බව නිරීක්ෂණය විය.

(i) රාජ්‍ය ව්‍යවසායන් පිළිබඳ පාර්ලිමේන්තු කමිටුව (COPE) විසින් ද නිර්දේශ කර ඇති පරිදි අමාත්‍යාංශ මට්ටමේ කමිටුවක් පත් කර හිඟ මුදල් රැස්කර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කරන මෙන් උපදෙස් ලබාදී තිබුණද ,පත්කර ඇති කමිටුව සඳහා අමාත්‍යාංශයේ නියෝජනයක් සිදුවී නොතිබීම.

(ii) අදාළ ණය මුදල් අයකර ගැනීම සඳහා ඇති නෛතිකමය හැකියාව පිළිබඳ විමර්ශනය කර නොමැති වීම සහ එසේ විමර්ශනය කිරීම තුළින් හඳුනාගනු ලබන ණයගැතියන්ගෙන් නීති ප්‍රකාරව, අදාළ හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබීම.

(iii) අවම වශයෙන්, දැනට ක්‍රියාත්මක සිනමා ශාලාවලින්, වාරික වශයෙන්, දීර්ඝ කාලීනව හෝ ලබාදී ඇති ණය මුදල් පියවා ගැනීමට විධිමත් ක්‍රියා පටිපාටියක් ඉහත ණය කමිටුවෙන් ඉදිරිපත් වී නොතිබීම.

(iv) ඉහත (ii ) හා (iii) අයකරගත හැකි ණය මුදල හැර ඉතිරි මුදල කපා හැරීම සඳහා අමාත්‍ය මණ්ඩලයට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු බව දන්වා තිබුණද එසේ සිදුකර නොතිබීම.

**(ඇ)** සංස්ථාවේ ගොඩනැගිල්ල ස්ථාපනය කර ඇති බෞද්ධාලෝක මාවතේ වරිපනම් අංක 303 දරන ඉඩමේ නෛතික හිමිකම ලබා ගැනීමට හා ඉඩමේ වටිනාකම ගිණුම්ගත කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් කටයුතු කර නොතිබුණි.

**4.3** **ආර්ථික නොවූ ගනුදෙනු**

---------------------------

භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිවිකුණුම් කිරීමේදී එකම බැංකුවක දිගින් දිගටම ආයෝජනය කර තිබූ අතර ප්‍රාථමික වෙළඳපලේ රාජ්‍ය බැංකු වලින් මිල ගණන් කැඳවා වඩා වාසි දායක පොලී අනුපාත මත ආයෝජන කිරීම සිදුකර නොතිබුණි. මහ බැංකුව මගින් නිකුත් කරන භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසියේ බර තැබූ සාමාන්‍ය පොලී අනුපාතයට වඩා සියයට 0.2 ක පමණ අඩු ප්‍රතිශතයකට 2016 දෙසැම්බර් 31 දිනට රු.264,903,027 ක් ආයෝජනය කර තිබුණි.

**4.4** **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ අරමුණට කිසිදු සම්බන්ධතාවයක් නොමැතිව සහ පදනම් කරගත් නෛතික විධිවිධානයකින් තොරව සංස්ථාවේ සභාපති විසින් රිත්මා මණ්ඩලයේ සිනමාශාලා 39 කට වර්ෂ කිහිපයක සිට සහ අනෙකුත් මණ්ඩල සිනමාහල් 16 ක් සමාලෝචිත වර්ෂයේදී රටබීම බලපත්‍ර නිර්දේශ කර තිබුණි.

(ආ) රාජ්‍ය අනුග්‍රහය යටතේ රටබීම බලපත්‍ර නිකුත් කිරීම ශ්‍රී ලංකා රජයේ “මතට තිත” ප්‍රතිපත්තියට එරෙහි ක්‍රියාවක් වන අතර, පවුලේ චිත්‍රපට සහ ළමා චිත්‍රපට ප්‍රදර්ශනය වන අවස්ථාවන්හිදී පවා රටබීම පානය සඳහා අවකාශය සැලසෙන පරිදි සිනමා ශාලා සඳහා රටබීම බලපත්‍ර නිර්දේශ කර තිබීම මතභේදාත්මක කරුණක් ලෙස නිරීක්ෂණය කෙරේ.

(ඇ) නිකුත් කර ඇති බලපත්‍ර ප්‍රකාරව රටබීම අලෙවි කළ හැක්කේ නරඹන්නන් සඳහා පමණක් වියයුතු වුවත් නරඹන්නන් නොවන පිරිස් වලට රටබීම අලෙවි කිරීම සහ රටබීම අලෙවි කිරීමේ අයිතිය බාහිර පුද්ගලයින්ට ලබාදී තිබූ බව නිරීක්ෂණය විය.

**4.5** **අරමුදල් ඌන උපයෝජනය**

-----------------------------------

සංස්ථාව සතු ජංගම බැංකු ගිණුම් 8 ක සාමාන්‍ය මාසික ශේෂය රු. 55,560,598 ක් වූ අතර එම මුදලින් කොටසක් කෙටිකාලීනව ආයෝජනය කිරීමෙන් අමතර ආදායමක් ලබා ගත හැකිව තිබුණද ඒ පිළිබඳව අවධානය යොමුකර නොතිබුණි.

## 4.6 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) එකතුව රු. 870,659 ක් වූ දළ සේයාපට සහ රසායන ද්‍රව්‍ය තොගය 2014 වර්ෂයේ සිට නිකුත් කිරීමකින් තොරව පැවතුණි.

(ආ) වටිනාකම රු. 156,800 ක් වූ ත්‍රීරෝද රථය අළුත්වැඩියා කිරීමට රු. 200,000 ක් වැයවන හෙයින් අළුත්වැඩියා කිරීම ඵලදායී නොවන බව 2017 සැප්තැම්බර් 22 දින වාහන යාන්ත්‍රික උපදේශක නිර්දේශ කර තිබුණද එය අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ප්‍රධාන කාර්යාලයේ සුහසාධන සංගමයෙන් ලබා දී තිබූ පුස්තකාල පොත් 500 කට අධික ප්‍රමාණයක් කැලණිය සරසවි චිත්‍රාගාරය තුළ අනාරක්ෂිතව ගොඩගසා තිබීම හේතුවෙන් දිරාපත් වෙමින් පැවැතුණි.

## 4.7 ප්‍රමාද වූ ව්‍යාපෘති

සරසවි චිත්‍රාගාරයේ චිත්‍රපට පශ්චාත් නිෂ්පාදන පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා 2015 වර්ෂයේදී රු. මිලියන 30 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබී තිබූ අතර ඒ සඳහා ලංසු කැඳවා තිබුණද ඒවා සංස්ථාවේ පිරිවිතරවලට නොගැලපෙන හෙයින් අවලංගු කර තිබුණි. අවශ්‍ය පිරිවිතර සැකසීම හා ඉදිරි කටයුතු වෙනුවෙන් ඉන්දියානු උපදේශකවරයෙකුට ඇමරිකානු ඩොලර් 8,000 ක් ගෙවා තිබුණද 2017 මැයි වන විටත් මෙම ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි. 2017 ව්‍යාපෘතිය අධියර 03 ක් යටතේ ඉටුකරවා ගැනීමට අවශ්‍ය උපදේශක සේවා පමණක් ලබාගෙන තිබුණි.

## 4.8 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 71 ක් වූ අතර වර්තමාන අවශ්‍යතාවයන් අනුව අනුමත කාර්ය මණ්ඩලය සමාලෝචනය කර නොතිබුණි. ඒ අනුව, අත්‍යාවශ්‍ය මාණ්ඩලික තනතුරු 02 ක්, කාලයක් තිස්සේම පුරප්පාඩු වී තිබීම හේතුවෙන් ඉහළ කළමනාකාරිත්වයේ මග පෙන්වීමක් හා අධීක්ෂණයක් යටතේ සැලසුම් සකස් කිරීමේදී, ඉලක්කයන් ගොඩනැගීමේදී හා එකී ඉලක්ක ළඟාකර ගැනීමට මෙහෙයවීමේදී ගැටළු පැන නැගිය හැකි බව නිරීක්ෂණය විය.

(ආ) සංස්ථාවේ පුරප්පාඩු වී පවතින තනතුරු පිරවීම සඳහා බාහිර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවා එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට 2016 වර්ෂයේදී සැලසුම් කර තිබුණද 2017 ජූලි 12 දින දක්වා කිසිදු බඳවා ගැනීමක් සිදුකර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

--------------------------------------------

## 5.1 සංයුක්ත සැලැස්ම

--------------------

සංස්ථාව විසින් සංයුක්ත සැලැස්මක් සකස් කර තිබුණද 2016 වර්ෂයේ දී ඒ අනුව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර ඒ අනුව කටයුතු කර නොතිබුණි.

## 5.2 ක්‍රියාකාරී සැලැස්ම

---------------------

සංයුක්ත සැලැස්මේ අරමුණු පාදක කරගෙන සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබුණි. ක්‍රියාකාරී සැලැස්මේ කාර්තුමය වශයෙන් ඉලක්කගත ක්‍රියාකාරකම් හඳුනාගෙන තිබුණ ද එහි කාර්යසාධනය ඇගයීමට හැකිවන පරිදි කාර්යසාධන වාර්තා පිළියෙල කර නොතිබුණි.

## 5.3 අභ්‍යන්තර විගණනය

-----------------------

අනුමත කාර්ය මණ්ඩලයට අනුව අභ්‍යන්තර විගණන අංශයේ ස්ථිර විගණන සහායක තනතුරු 03 ක් තිබිය යුතු වුවද 2016 දෙසැම්බර් 31 දින වන විට කිසිදු සහායකයකු සේවයේ යොදවා නොතිබුණි. ඒ අනුව අභ්‍යන්තර විගණන කටයුතු සම්බන්ධයෙන් සංස්ථාව ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොමැති බව නිරීක්ෂණය විය.

## 5.4 විගණන කමිටු

-----------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාරව අවම වශයෙන් මාස තුනකට වරක්වත් විගණන කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.

## 5.5 ප්‍රසම්පාදන සැලැස්ම

----------------------

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ආ) වගන්තිය ප්‍රකාරව අවම වශයෙන් වසර තුනක කාලයක අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් හා 4.2.2 අනුව ප්‍රසම්පාදන කාල සටහනක් ද, සකස් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා පමණක් ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර තිබුණි. තවද ඉතා හදිසි අවශ්‍යතාවයන් ලෙස කාබන් මිලදී ගැනීම, පරිගණක ජාල ගත කිරීම අංක තාක්ෂණ සිනමා පැකේජ තත්ත්ව පරීක්ෂණ අංකික තාක්ෂණයට පත් කිරීමට රු. මිලියන 16 ක් හා සාමාන්‍ය අවශ්‍යතාවයන් ලෙස පරිගණක උපාංග සහ විදුලි උත්පාදක යන්ත්‍ර මිලදී ගැනීමට රු. මිලියන 15 ක් වෙන්කර තිබුණද එම කටයුතු ඉටුකර නොතිබුණි.

## 5.6 වාර්ෂික වාර්තා සභාගත කිරීම

--------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ප්‍රකාරව 2013 හා 2014 වර්ෂවල වාර්ෂික වාර්තා 2017 මැයි 23 වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

# 6. පද්ධති හා පාලනයන්

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) වත්කම් පාලනය | (i) චිත්‍රාගාරයේ තිබෙන නිෂ්කාර්ය වත්කම් හඳුනාගෙන අවශ්‍ය කටයුතු සිදුනොකිරීම.<br>(ii) පුස්තකාල පොත් අනාරක්ෂිත පවත්වා ගැනීම.<br>(iii) ඉන්වෙන්ට්‍රි ලේඛනය ලැබීම් නිකුත් කිරීම් හඳුනා ගැනීමට පහසු වන ආකාරයෙන් නිසි පරිදි නඩත්තු කර නොතිබීම |
| (ආ) ණයගැති පාලනය | (i) වර්ෂ 10 කට වඩා අයනොවී පවතින ණය ශේෂ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම.<br>(ii) ණය ගිවිසුම් පිළිබඳ නිසි අධීක්ෂණයක් නොතිබීම.<br>(iii) ණය අයකර ගැනීමේ වැඩ පිළිවෙලක් හෝ අංශයක් පිහිටුවා නොතිබීම. |
| (ඇ) ආදායම් පාලනය | (i) චිත්‍රපට කුලී ආදායම සහ වාර්ෂිකව අයවිය යුතු බදු මුදල් අයකර ගැනීම් පිළිබඳ අධීක්ෂණයක් නොවීම.<br>(ii) සිනමාශාලා වලින් මුදලින් ලද ආදායම තහවුරු කර නොගෙන නිෂ්පාදකයාගේ කුලී ආදායම් කොටස ගෙවීම. |
| (ඈ) ණය පාලනය | චිත්‍රපට ප්‍රචාරණ ණය මුදල් අයකර ගැනීමේදී ගිවිසුම් ප්‍රකාරව පළමු ආදායමින් අය නොකිරීම. |
| (ඉ) පරිගණක මෘදුකාංග පද්ධති පාලනය | (i) එක් එක් නිලධාරියාගේ මට්ටම සඳහා හා පෞද්ගලික මුරපද ලබා නොදීම.<br>(ii) ප්‍රධාන ගොනුවේ දත්ත වෙනස් කිරීම මාණ්ඩලික නිලධාරියකු විසින් සිදු නොකිරීම සහ අධීක්ෂණය නොකිරීම.<br>(iii) ලබාගන්නා වූ උපස්ථක (backup) එම ස්ථානයේම තැබීම.<br>(iv) Teamviewer මෘදුකාංග සහ අන්තර්ජාල පහසුකම් මගින් පිටස්තර පුද්ගලයින්ට වැටුප් සැකසීමේ පද්ධතියට ඇතුල්වීමේ අවදානමක් පැවතීම. |